# වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# තේ පර්යේෂණ මණ්ඩලය

## අධ්‍යක්ෂ

තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ඉහත තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**රැකියා විස්තරය:**

ආයතනයේ සියලුම පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම්, පරිපාලන හා මූල්‍ය කටයුතු සඳහා වගකීම දැරිය යුතු අතර, ආයතනයේ කාර්ය මණ්ඩලයට නායකත්වය සහ දිරිගැන්වීම ලබා දිය යුතුය.

**සුදුසුකම් සහ පළපුරුද්ද:**

**බාහිර:**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විශේෂ උපාධියක් සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක්.

**සහ**

පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර විස්සක (20) කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද සහ කළමනාකරණ පළපුරුද්ද, එයින් වසර දොළහක් (12) ආචාර්ය උපාධිය (PhD) ලබා ගැනීමෙන් පසු විය යුතු අතර සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර පහක් (05) ක සනාථ කළ වාර්තා සමඟ ඉදිරිපත් කළ යුතුය.

**සහ**

පර්යේෂණ විද්‍යාඥයින් / ව්‍යාප්ති විද්‍යාඥයින්ගේ බහු ශික්ෂණ කණ්ඩායම් මෙහෙයවීමට ඇති හැකියාව, මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම මෙන්ම කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

**අභ්‍යන්තර:**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර හතරක (04) දෙවන පෙළ සාමාර්ථය සහිත විශේෂ උපාධියක් සහ අදාළ විෂය ක්ෂේත්‍රයක ආචාර්ය (PhD) උපාධියක් ලබා තිබීම සහ තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස වසර තුනක (03) සතුටුදායක සේවාවක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ - පර්යේෂණ / ව්‍යාප්ති ලෙස වසර පහක (05) සතුටුදායක සේවාවක් හෝ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන උපදෙස් නිලධාරී ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක්

**හෝ**

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාව / කෘෂිකර්මය හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සමඟ වසර දෙකක (02) පශ්චාත් පර්යේෂණ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය (PhD) උපාධියක් සමඟ තේ පර්යේෂණ ආයතනයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස වසර තුනක (03) සතුටුදායක සේවාවක් හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ- පර්යේෂණ / ව්‍යාප්ති ලෙස වසර පහක (05) සතුටුදායක සේවාවක් හෝ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන උපදෙස් නිලධාරී ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක්

**සහ**

බහු ශික්ෂණ පර්යේෂණ විද්‍යාඥ කණ්ඩායම් මෙහෙයවීමට ඇති හැකියාව, මානව සහ අනෙකුත් සම්පත් නිසි ලෙස යෙදවීම මෙන්ම කාර්යක්ෂම කළමනාකරණය පිළිබඳ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

**වැටුප් පරිමාණය :** HM 2-3 (2025) රු. 173,000 - 12 X 4,850 - රු. 231,200 (මාසිකව) (රු. 173,000/- ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලැබේ. (2026.01.01 දින ගෙවන ලද වැටුප රු. 150,325/- ක් වන අතර නොගෙවන මුදල රු. 22,675/- කි).

**වයස:**

අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමය:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**වෙනත් ප්‍රතිලාභ:**

i. **අර්ථසාධක අරමුදල :** තෝරාගත් අපේක්ෂකයා වැටුපෙන් 10%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු අතර, ආයතනය විසින් 15%ක් දායක වේ. ආයතනය සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ද ලබා දෙනු ඇත.

මෙම තනතුර ස්ථිර තනතුරකි. සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාව සමග උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම්වල පිටපත්, සේවා සහතික සහ අයදුම්කරු පිළිබඳව සොයා බැලිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සමග 2026 මාර්තු මස 16 වැනි දින හෝ ඊට ප්‍රථම පහළ අත්සන් කර ඇති අය වෙත ලියාපදිංචි තැපැලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා යොමු කළ යුතුය. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට අවකාශ ඇත. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය වැඩි විස්තර සඳහා තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත පිවිසෙන්න.

**සභාපති,**
**තේ පර්යේෂණ මණ්ඩලය**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**
**ශාන්ත කුම්බ්ස්, තලවාකැලේ.**